# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2016

14-07-2016

**පෙරදිග සංගීතය** **8 ශ්‍රේණිය**

විභාග අංකය :................................................ කාලය පැය 02 යි

### I කොටස

★ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

★ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. නිර්දේශිත රාග අතරින් ශුද්ධ ස්වර පමණක් යෙදෙන රාග යුගලය වන්නේ,
    (1) බිලාවල් සහ කාෆි වේ. (2) බිලාවල් සහ භූපාලි වේ.
    (3) යමන් සහ බිලාවල් වේ. (4) කාෆි සහ භූපාලි වේ.

02. මධ්‍යමය සහ නිෂාධය යන ස්වර වර්ජිත වන රාගය වන්නේ,
    (1) බිලාවල් ය. (2) කාෆි ය. (3) භූපාලි ය. (4) යමන් ය.

03. "සරුංගලේ වරල් සැලේ" යන ගීතය නිර්මාණයට පාදක වූ රාගය වන්නේ,
    (1) කාෆි රාගය යි. (2) භූපාලි රාගය යි. (3) බිලාවල් රාගය යි. (4) යමන් රාගය යි.

04. තාලයක, කාලය මනින කුඩාම ඒකකය සේ සැලකෙන්නේ,
    (1) විභාගය යි. (2) ඨේකාව යි. (4) අනුතාල යි. (4) මාත්‍රාව යි.

05. මාත්‍රා 16 ක් සහිත හින්දුස්ථානි තාලයට සමානව මාත්‍රා කැටිවන දේශීය තිත්රූපය වන්නේ,
    (1) මහ තනිතිත ය. (3) මැදුම් තනිතිත ය.
    (4) සුළු තනිතිත ය. (5) මැදුම් මහ දෙතිත ය.

06. සරල ගීතයක මුලින්ම වාදනය වන කොටස හඳුන්වන්නේ,
    (1) Song නමිනි. (2) Interlude නමිනි.
    (3) Introduction නමිනි. (4) Verse නමිනි.

07. 'රවීන්ද්‍ර සංගීතය' සඳහා බහුලව භාවිත කරන ස්වර වාද්‍ය භාණ්ඩය වන්නේ,
    (1) වයලීනය යි. (2) එස්රාජය යි. (3) සිතාරය යි. (4) ගිටාරය යි.

08. වන්නමක ඇති අර්ථය ප්‍රකාශ නොවන පද කොටස හඳුන්වන්නේ,
    (1) අඩව්ව නමිනි. (2) කවිය නමිනි. (4) සීරුමාරුව නමිනි. (4) තානම නමිනි.

09. දොංදො / ජිංගත / ජිගත / දොංතක යන බෙර පදය වාදනයට සුදුසු වන්නමක් වන්නේ,
    (1) තුරඟා වන්නම ය. (2) නයියඩි වන්නම ය.
    (3) උකුසා වන්නම ය. (4) තිසරා වන්නම ය.

10. සමාජයේ යහපත් ආකල්ප සංවර්ධනය සඳහා ප්‍රබලව යොදා ගත හැකි ගීත විශේෂයකි,

(1) චිත්‍රපට ගී. (2) කෝලම් ගී. (3) උපදේශාත්මක ගී. (4) රාග ගී.

★ හිස්තැනට සුදුසු පිළිතුර ලියන්න.

11. සිතාරය වයනු ලබන්නේ ......................................... නැමති උපකරණයෙනි.

12. මුඛඩා, පරන්, තිහායි යනු ......................................... පදවිශේෂයන් ය.

13. වයලින් පවුලේ විශාලතම භාණ්ඩය ......................................... වේ.

14. ඛ්‍යාල් ගායනයේදී 'අ' කාරයෙන් ස්වර ඇදීයන ලෙස ගායනා කරනු ලබන කොටස හැඳින්වෙන්නේ ......................................... නමිනි.

15. බටනලාවේ සියලු ම සිදුරු විවෘතව වාදනය කළ විට ................................ ස්වරයේ හඬ නිකුත් වේ.

● A කොටස හා B කොටස නිවැරදිව ගළපා ඉරකින් යා කරන්න.

| | A | B |
|---|---|---|
| 16. | එස්රාජය | ප්‍රශස්ති |
| 17. | සසර වසන තුරු | තබ්ලාව |
| 18. | මුද්‍රප්පදය | අලුව |
| 19. | අතුරු වාදන | පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේව |
| 20. | කායදා | සරල ගී |

(ලකුණු 20)

## II කොටස

★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

01. (1) ඔබ උගත් රාග ඇසුරින් පහත දක්වා ඇති වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| රාගය | ආරෝහණ | අවරෝහණ | වාදී | සංවාදී | ජාතිය | ගාන සමය | මේලය |
|---|---|---|---|---|---|---|---|
| බිලාවල් | | | ධ | | | දිවා ප්‍රථම ප්‍රහරය | බිලාවල් |
| | සරිගපධසං | | | ධ | | | |
| කාෆි | | | ප | | සම්පූර්ණ | | කාෆි |

(2) ඉහත රාග අතුරින් එක් රාගයක සර්ගම් ගීතයක ස්ථායි කොටස පමණක් නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කර රාගය නම් කරන්න. (ලකුණු 7 + 3 = 10 යි)

02. (1) තනිතිතේ ප්‍රභේද නම් කරන්න.

(2) එයින් එක් ප්‍රභේදයකට අයත් බෙර පදයක් නියමිත මාත්‍රා සහ තිත් සංඥා සහිතව ප්‍රස්තාර කරන්න.

(3) කෙහෙරුවා තාලයට අනුව ඕනෑම ගී පාදයක් ප්‍රස්තාර කර දක්වන්න.

(ලකුණු 3+3+4 = 10 යි)

03. (1) උඩරට වන්නමක කොටස් නම් කරන්න. (නර්තනයට අදාළව)

(2) ඔබ උගත් වන්නමක තානම සහ කවිය ලියා දක්වන්න.

(3) ප්‍රශස්ති පිළිබඳව ඔබ දන්නා කරුණු 3ක් ලියා දක්වන්න. (ලකුණු 3+4+3 = 10 යි)

04. (1) තබ්ලාවක දළ රූප සටහනක් ඇඳ එහි කොටස් 5ක් නම් කරන්න.

(2) හින්දුස්ථානි තාල පදයක් නම්කර නිවැරදි තාල සංඥා සහ මාත්‍රා සහිතව ප්‍රස්තාර කරන්න.

(ලකුණු 7 + 3 = 10 යි)

05. (1) සරල ගීතයක ආකෘතිය පිළිවෙළින් ලියා දක්වන්න.

(2) ඉන් කොටස් දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 5 + 5 = 10 යි)